සරන කල සසර මග
ගමනකදි අතරමග
හමුවුනා ඔබව මට
පෙර පැතුම් විලසකින්

හමුවුනත් පළමු දින
පෙර සසර සරන කල
පැතුමකින් වෙන්න ඇති
ඔබ එදා කී වදන් මතකයේ රැඳී ඇත

(ආදරේ ඔබෙ ඇසින්
මගෙ ඇසට ඉඟි කලා
මුළු ලොවම ඇති එළිය
ඉඟියකින් බිහි කලා )

භීතියෙන් සැලුන හිත
ශීතලෙන් ගැහුන ගත
හදවතට තුරුළු කොට
ඔබ එදා කී වදන්
මතකයේ රැඳී ඇත

දිවි කතර එකලු කල
ඔබෙ නුවන් යුවල මට
දිවිකතර එකලු කල
ඔබෙ සුමුදු මුහුණ මට

හිරු එළිය සඳ එළිය
නැති වුවත් දිනෙක මට
අඳුර පලවා ලමින්
සුදු එළිය ගෙනෙනු ඇත

කුසුම විජේරත්න පේරාදෙණිය සරසවියේදී
1967